## කෙටිකතාව

# කුණා



### ලක්ෂ්මන් කොඩිතුවක්කු

ඔහු බොහෝ කාලයක් පුරා රාත්‍රියේදී දුටුවේ නපුරු සිහිනය. ඒ නපුරු සිහින සුන්දර සිහින බවට පෙරළාගන්නට ඔහු දැරූ වෙහෙස සාර්ථක වන බව අවබෝධ වන විට ඒවා සිහින ලෙසින්ම තබා ගන්නට ඔහුට උවමනාවක් නොවීය. මිනිසා විසින්ම නිර්මාණය කළ, නැවත පිළිකුල් කර අහක බලන එම කන්ද දහදිය මුගුරු පෙරාගෙන ඔහු දිනපතා තරණය කළේය. කඳු පිළිබඳ වැඩි අවබෝධයක් නැති ඔහුට මෙය කන්දක් වූයේ කෙසේදැයි නොසිතෙයි. මිනිසුන් විසින්ම මෙය ක්‍රම ක්‍රමයෙන් ඉහළට නංවන නිසා මෙය කන්දක් වන්නට ඇතැයි සිතන්නටද වෙලාවක් නැති තරමටම ඔහු දැන් කාර්ය බහුල වී ඇත.

මිනිසෙකුගේ හිත පිරෙන්නට පෙර, කුස පිරෙන්නට ඕනෑ බව ඔහුට කියාදුන්නේ අම්මාය. හිත කඩා වැටී, කුසගින්න දරාගත නොහැකිව අඬමින් හිස් අහස දෙස බලා සිටින, ඔහු අසළට විත් අම්මා හිස අත ගෑ හැටි ඔහුට මතක් වේ.

"තාත්තා රෑට මොනාහරි අරගෙන ඒවි මයෙ පුතේ. ටිකක් ඉවසපන්." ඇය එසේ කියන්නේ තමන්ගේ දෑස්වලින්ද කඩා හැලෙන කඳුළු කැට චීත්තයෙන් පිස දමමිනි. එහෙත් අම්මා කියූ ලෙස තාත්තා ගෙදර එන්නේ නැත. ආවත් සණ්ඩු සරුවල්ය. එවැනි දිනවලදී බඩගින්න කොච්චර හොඳදැයි ඔහුට සිතෙයි. මහ මන්දිරවල ජීවත් වන උත්තමයන් දකින්නේ සුන්දර සිහින බවත්, අපි වගේ ඇත්තන් දකින සිහින නොදැක ඉන්න තරමට හොඳයැයි අම්මා කියූ විට ඔහු මුව විවර කර ඇස් ගෙඩි දෙක උලුප්පා අම්මා දෙස බලා උන් හැටි තවමත් මතකය. අම්මා හිතේ දුකට හෝ නැත්නම් කේන්තියට එසේ කීවද කුස පිරුණු දාට සුභ සිහින පෙනෙන බව ඔහුටද පසු කලෙක පසක් විණි.

''සමනොළ කන්ද මුදුනින් ගලා එන පුංචි දිය ධාරාව මුහුදට වැටෙන්නේ මහ ලොකු ගඟක් වෙලා'' කවි පද කියා දෙන්නට පෙර විල්සන් ගුරුතුමා කැළණි ගඟ පිළිබඳව කියා දුන් බොහෝ දෑ ඔහුට මතකය. එවරස්ට් කඳු වැටිය පිළිබඳව ඔහු දැනගත්තේ මෑතකදීය. ඒ පත්තර කෑල්ල ඔහුගේ අතට හමුවුණේ කුණු කන්දෙනි. එම අපූරු පත්තර පිටුව ඔහුව එවරස්ට් කඳුවැටිය කරා රැගෙන ගියේ කන්දක් ගැනම ලියැවී තිබූ නිසාය. කන්ද තරණය කිරීමට ගොස් අතරමගදී මිය ගිය පුද්ගලයෙකු ගැන ලියැවී තිබූ එම විස්තරය ඔහුව අලුත් ලෝකයකට ගෙන ගියේය.

කැළණි ගඟින් ගලායන මහා දිය කඳ මෝය කටින් මුහුදට එකතුවන බව ගුරුතුමා කියා දෙන විට ඒ චමත්කාරජනක රූප රාමු හිතින් මවාගෙන ඔහු සතුටක් ලැබුවේය. එහෙත් කරදඬු උස්මහත් වන විට ඔහු සෙයිලම සොයා ආවේ ඒ චමත්කාරය විඳින්නට නොවේ. අම්මා කියාදුන් සුන්දර සිහින දකින්නටය. රැකියාවක් සොයාගැන්මේ අරමුණින් කොළඹට සේන්දු වූ ඔහුට, ගඟවත්, මුහුදවත් සුන්දර තැනක් නොවීය. තමා ලෙසම ජීවිතය ජීවත් කරවීමට දඟලන මිනිසුන්ගේ පැතුම් බොඳවී ගිය මුහුණු කැළණි ගඟට වැටී මෝය කටින් මුහුදට එකතු වන හැටි ඔහුට මැවී පෙණුනේය. මුහුදු රළට එකතුවෙන එම මුහුණු පතුලට ගිලා බැස නැවත ගොඩට ගලන්නේ ඔහුගේ පැතුම්ද සුන් කර බව ඔහුට පෙණුනේ කවදාත් පෙනෙන සිහින අතරින්ය.

එහෙත් ඔහු තම ව්‍යායාමය අත්හැරියේ නැත. රැකියාවක් සොයාගැන්මේ අරමුණින් අහුමුළු, කඩපිල් තම නිදියහන කරගිනිමින් නාටාමියෙක් ලෙස ඔහු මුට්ට කර ගැසුවේය. ඔහුට වයලට්ව මුණ ගැසෙන්නේ නාටාමියෙක් ලෙස මුට්ට කරගසන අතරතුරේය. වැන්දඹුවක් වූ වයල්ට් තමාට ආදරය කරන බව තේරුම්ගත් ඔහු, ඇය ඔහුගේ සිහින මාලිගාවේ සහකාරිය කරගත්තේය. කන්ද පාමුල වත්තේ ඇති වයලට්ගේ නොවනා වයලට්ගේම පැල්පත ඔහුට සුභ සිහින පෙනෙන මහා මන්දිරයක් බවට පත් කර ගත්තේය.

''නින්ද ගියායින් පස්සේ අපි දන්නෙ නැහැනේ වයලට් කොහේ නින්ද ගියාද කියල. ඊට පස්සේ මේ පැල්පතත් එකයි මහ මන්දිරෙත් එකයි... නැද්ද මං අහන්නේ'' මුට්ට කර ගසමින් සොයාගන්නා මුදලට වඩා මේ පෙනෙන කුණු කන්දෙන් ජීවිතය සරුකර ගත හැකි බව ඔහුට පෙන්වා දුන්නේ වයලට්ය.

කුණු කන්දක් වුවත් ඒ කන්ද මුදුනින් හිරු පායා එන්නේ හැම කන්දක්ම එක ලෙස සළකාය. හිරුට බේදයක් නැත. එහෙත් මේ මහ පොළොවේ හිරටත් වෛරකරන මිනිසුන් ඉපදෙන බව ඔහු දනී පැල්පතේ සිට කුණු කන්ද දෙස ඔහු බලා සිටින්නේ චණ්ඩ හිරු පායා උණුසුම දෙන්නට කලින් කන්ද නැග බැසගන්නටය. හවස් වන විට ට්‍රැක්ටර් වලින් ගෙන එන කුණු ඒ කන්ද තව තවත් උස්මහත් කරන බව ඔහු දනී. හිරු පායන විට කන්ද කළුම කළු පාටය. ඒ කළු පාටට ඔහු පෙම් කළේය. කුණු කන්දෙන්ම සොයාගත් පරණ බූට් සපත්තු ජෝඩුව පයේ දවටාගෙන ගෝනි පඩංගු ටික කිහිල්ලට තද කර මිනිත්තු කිහිපයකින් ඔහු කන්ද තරණය කරයි.

''මිනිස්සු හිතන්නේ වයලට් ඉහළ නගින හැම දෙයක්ම කන්දක් කියලනෙ. මිනිස්සු හදන කඳුයි ඉබේ හැදෙන කඳුයි කොච්චර වෙනස්ද. මට හිතෙනව දවසක වයලට් එක්ක ගිහිල්ල ශ්‍රී පාදෙ වැඳ පුදාගෙන එන්න. අද හොඳ කාඩ්බෝඩ්, යකඩ කෑලි ටිකක් හම්බ උනොත් අපිට ඒ සිරිපාදෙ නැගල වැඳ පුදාගෙන එන්න පුළුවන්''

අවට ජනයා කුණු කන්දට වෛර කරන විට ඔහු කිසිවක් නොපවසා එයට පෙම් කළේය. කුණු කන්දෙන් එකතු කරන කඩදාසි, බෙලෙක් ටින්, යකඩ කැබලි, වීදුරු ආදිය මුදල් බවට පෙරළෙන විට ඒ ආදරය තව තවත් ශක්තිමත් වූයේ වයලට්ගේද ආශිර්වාදය මැදය. වත්තේ ජනයා ඔහුව ඇමතුවේ ''කුණා'' කියාය. "ඒකට ගඳ දැනෙන්නේ නැහැ. නහයක් නැති එකෙක්." තවකෙකු කියයි. එදා වයලට් අක්කාගේ ගේ කෑල්ල අද කුණාගේ ගෙදර බවටත්, වයලට් ''කුණාගේ ගෑනි'' බවටත් පත් වී ඇත්තේ කන්ද විසින් මැවූ වෙනසක අරුමෙන් බව ඔවුන්ට නොදැනිණි.
''ඇඩ්ඩින් ගොයියා දවසක් මගෙන් අහනව... උඹ වැඩියෙන්ම ආදරේ වයලට්ටද නැත්තං කුණු කන්දටද කියල. මං කිව්ව වයලටුයි කුණු කන්දයි කියන්නෙ මට දැන් දෙකක් නෙවෙයි එකක් කියල. ආදරේ කරන්නත් ජීවත් වෙලා ඉන්න එපාද. නේද මං අහන්නේ වයලට්. ඇත්තටම මේ කුණු, කුණු වෙලා එන්න ඉස්සර හොඳ දේවල් විදියටනෙ මිනස්සුන්ගේ අතට එන්නෙ වයලට්. පස්සෙ තමයි ඕව කුණු වෙන්නේ. දැන් බලන්න මිනිස්සු මාළුවගේ ඔලුව, වරල් එහෙම කපල, කඳ එක එක විදියට රස කර කර කනවා. ඕක නොකෑවනං ඒකත් අර ඔලුව වරල් වගේම කුණු වෙනවනේ. අනෙක ඔය ඔක්කොම මේ ශරීර කූඩුව ඇතුළෙ දිරවලා මිරිකිලා එළියට එන්නෙත් කුණු විදියටනේ. මිනිස්සු දන්නෙ නැහැ නෝනෙ කන්නෙ කුණු කියල. මැරුණාම කුණු වෙනවා කියල''

ඔහු අවට ජනයා ගඳට එරෙහිව ගෙන යන සටන අසාධාරණ බැව් පෙන්වන්නට උත්සාහ ගත්තේය. කුණු කන්ද සාධාරණීකරණය කිරීමට ඔහු උත්සාහ ගත්තේ වයලට් සමග එකතුව පමණි. වත්තේ කිසිවෙකු සමග ඒ පිළිබඳව කිසිවක් කතා නොකරන ඔහු වයලට්ගේ හූ මිටි මැද සැමදාම ජයග්‍රහණය කළේය.

"ඔය කුණු කන්ද විතරද මිනිස්සු ලෙඩ කරන්නේ. පළාතම ගඳ ගස්සන්නෙ, අර මාටියගේ පුතා වත්තේ කුඩු විකුණනවා ඒවා ගඳ නැති වුණාට

**කුණු ගොඩේ පෙට්ටියකට යටවී තිබූ පොලිතින් මල්ල ලිහා බැලූ ඔහුට මේ මුද්ද අහම්බෙන් ලැබුණු තෑග්ගකි. ඔහු එය හිරු එළියට අල්ලා බැලුවේ රත්තරන් යැයි සිතාය. තරමක් දිස්නය දෙන නිසා ඔහු එය රත්තරන් යැයි සිතුවේය. ඔහු එය සාක්කුවට ඔබාගත්තේ කිසි දිනෙක තමා අතින් තිළිණයක් නොලද වයලට්ට ලබා දෙන අදහසිනි.**

කොච්චර විෂද ..... එතකොට වාහන වලින් එන ඩීසල් පෙට්‍රල් ගඳ, ඒ විෂ මිනිස්සු ලෙඩ කරන්නෙ නැද්ද ?... මේ කුණු කන්ද එන්න කලින් වත්තේ එවුන්ට ලෙඩ රෝග හැදුනෙ නැද්ද මං අහන්නේ. මිනිස්සු මලේ නැද්ද... උන්ට පිස්සු." ඔහු තම හෘද සාක්ෂියට අනුකූලව කුණු කන්ද වර්ණනා කළේය. වත්තේ ජීවත් වෙන චම්පලා, පාතිමාලා, සූර්යකාන්තිලා ඇඟ පුරා විලවුන් උලාගෙන තොල් රතු කරගෙන මුළු පළාතම සුවඳ කරමින් වත්තෙන් එළියට බහින්නේ ඇඟ විකුණන්නටය. ඒ මුදලින් දරු පවුල ජීවත් කරවන්නටය. එහෙත් කුණාට අනුව පළාතම ගඳ ගස්සන්නේ ඔවුන්ය.

''උන් හිතන් ඇති උන් ලඟ සුවඳයි කියල. ඕවට තමයි ගඳ ගස්සනවා කියන්නෙ වයලට්''

''කට වහගන්න අනේ. උන්ට ඇහුණොත් එහෙම අම්ම අප්ප මතක් කරල තමයි පස්ස බලන්නේ'

ඒ වෙලාවට වයලට් ඔහුගේ කට වැසීමට උත්සාහ ගන්නේ දෑත් විදහාය. එවිට වයලට්ගේ මැදඟිල්ලට වැටී ඇති මුද්ද දකින විට සියුම් ආශාවක් ඔහුගේ හිත තුළ ජනිත වේ.

''මෙන්න වයලට් මං ගානෙ උඹට තෑග්ගක්''

කුණු ගොඩේ පෙට්ටියකට යටවී තිබූ පොලිතින් මල්ල ලිහා බැලූ ඔහුට මේ මුද්ද අහම්බෙන් ලැබුණු තෑග්ගකි. ඔහු එය හිරු එළියට අල්ලා බැලුවේ රත්තරන් යැයි සිතාය. තරමක් දිස්නය දෙන නිසා ඔහු එය රත්තරන් යැයි සිතුවේය. ඔහු එය සාක්කුවට ඔබාගත්තේ කිසි දිනෙක තමා අතින් තිළිණයක් නොලද වයලට්ට ලබා දෙන අදහසිනි.

''මේක රත්තරන් වගේ උනාට රත්තරන් නෙමෙයි අනේ. ඒ වුණාට මට මේක රත්තරන් තරම්ම වටිනව. ඇය එය මැදඟිල්ලට දමා හැඩ බැලුවාය. ඒ මුද්ද දෑතට ලැබුණු පසු වයලට්ගේ දෑත් ලස්සනවී ඇතැයි ඔහුට සිතෙයි.

***************

''කුණා උඹත් එන්න ඕනේ පිකටින් එකට... මේ ගඳ කොහොම ඉවසගන්නද බං.. උඹට නාස් පොල්ලක් නැති වුණාට අපිට තියෙනවනේ. පන්සලේ හාමුරුවෝ කිව්වා උඹටත් එන්න කියල''

වත්තේම සිටින මංජු අයියා ඔහුට එම පණිවිඩය ගෙන ආවේ කටගොන්නක් බීගෙනය. ඔහුගේ මුවින් ගලා එන මත්පැන් ගඳ කුණු කන්දට වඩා ගඳ යැයි ඔහුට දැනුණේය. ඒ සමගම මංජුලගේ දෑඟිලිවල රැඳි අඩක් පිළිස්සුණු සිගරට් කොටය දෙස ඔහු බලා සිටියේ පිළිකුළෙනි.

''මං කුණු කන්දට කැමති මාව ජීවත් කරවන නිසා... ඔය උඹ ඉඳහිට ගිහිල්ල කරන බිල්ඩින් රස්සාව වගේ''

''බිල්ඩින් රස්සාව ගඳ නැහැනේ කුණා අයියා. ඒ වගේද මේ ගඳ.. ජීවිතයක් නැහැනේ'' ඔහු දෙපසට වැනෙමින් උත්තර බඳියි.

''හාමුදුරුවන්ගෙ වචනෙ මට අහක දාන්න බැහැ. මාත් එන්න බලන්නං''

පන්සලේ ලොකු හාමුදුරුවන්ගේ ඉල්ලීම අහක දාන්නට බැරිය. වත්තේම සිටින කිහිපදෙනා අතරින් ඔහුද පන්සලට බොහෝ හිතවත්ය. එදා සිටි තම මිය ගිය අම්මා වෙනුවෙන් ඔහු වසරක් පාසා පන්සලට දානය පිරිනමන්නේ මේ කුණු කන්දෙන්ම එකතු කරන අබලි ද්‍රව්‍ය විකුණා ලැබෙන මුදලකිනි.

''මං දන්නවා ජිනපාල තමුන් ජීවත් වෙන්නේ ඔය කුණු කන්දෙන් ලැබෙන දේවල් විකුණාල කියල. ඒත් මේක මේ පළාතටම පිළිලයක්. ඔය දියුණු රටවල නං ඕව පොහොර, ගෑස් වගේ දේවල්වලට හරෝල ප්‍රයෝජනයක් ගන්නවා. ඔය ප්‍රතිචක්‍රීකරණයද මොකක්ද කියන්නේ ඕකටනේ. අපේ අය ඉතින් කවද ඕවයින් ප්‍රයෝජනක් ගනීද මන්ද? කොහොමත් මේ විරෝධය දක්වන්න කලින් අපි ඇමතිතුමාත් එක්ක නැවත වරක් කතා කරනවා. මේ සැරේ හරියටම නිශ්චිත විසඳුමක් ලැබුනොත් අපි ඕක කල්දාන්න ඉන්නේ''
ඔහු යටහත් පහත්ව හාමුදුරුවන්ගේ දේශනය අසා සිටියේය.

''අපේ හාමුදුරුවනේ, මාත් ටික ටික හරි එකතු කරල ඔය දේමනේ කරන්නේ. ඇයි අප වගේ මිනස්සු ටිකක් එකතු කරගෙන ආණ්ඩුවට ඔය දේ කරන්න බැරි."

''ඕවට යන්ත්‍ර සූත්‍ර ඕනේ ජිනපාල.. අතින් ටික ටික එකතු කරල හරියන්නේ නැනෙ. අනෙක ජිනපාල එකතු කරන්නේ ප්‍රයෝජනයක් ගන්න පුළුවන් දේවල්නේ. එහෙම ගන්න බැරි දේවල් වලින්නේ ඔය කුණු කන්ද උස්මහත් වෙන්නේ."

ඔහු බලාපොරොත්තු සුන්වූ දෑසින් ලොකු හාමුදුරුවන් දෙස බලා සිටියේය.

28 වන පිටට